ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණ සහතික පත්‍ර වැඩසටහන - දෙවන මට්ටම
අවසාන පරීක්ෂණය - 2018
ව්‍යවසායකත්වය - MCC1201

කාලය : පැය දෙක (02)යි.

දිනය : 2018.10.20 වේලාව: පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00

උපදෙස්:

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.
- පිළිතුරු විධිමත් ලෙස අදාළ ප්‍රශ්නයට කේන්ද්‍රගත කළ යුතුය.

01. (අ) ව්‍යවසායකත්වය පිළිබඳ ඔබේ සිතට හැගෙන සංකල්පය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ආ) ඔබ ප්‍රදේශයෙහි ඇති ව්‍යාපාරයක් තෝරා ගෙන ව්‍යවසායකයකු බිහිවීමට බලපෑ පසුබිම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ඇ) ව්‍යවසායකයකු වශයෙන් ඔබ තෝරා ගන්නා ව්‍යාපාරය නම් කරන්න. එම ව්‍යාපාරයට ගැලපෙන දැක්ම (Vision) මෙහෙවර (Mission) හා පරමාර්ථ (Objectives) සටහන් කරන්න. (ලකුණු 10)

02. "කවර හෝ අවදානමක් බාර ගෙන අරමුණු කරා ලඟාවීමට ප්‍රයත්න දැරීම ව්‍යවසායකයන් ප්‍රකට කරවන ලක්ෂණ වේ."
ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබගේ මතය කුමක්ද? සුවිශේෂී උදාහරණ දෙන්න. (ලකුණු 25)

03. "කුඩා ව්‍යාපාර ශ්‍රී ලාංකික ප්‍රාදේශීය හා ජාතික ආර්ථිකයේ වටිනා කාර්යභාරයක් ඉටු කරයි."

(අ) කුඩා පරිමාණ ව්‍යාපාරවල පොදු ලක්ෂණ මොනවාද? (ලකුණු 05)

(ආ) ඔබේ අදහසට අනුව "කුඩා ව්‍යාපාර" වීමේ වාසි මොනවාද? (ලකුණු 10)

(ඇ) ශ්‍රී ලංකාවේ අද පවතින තත්ත්වය අනුව කුඩා ව්‍යාපාරවල භූමිකාව කොපමණ වැදගත්වේද? (ලකුණු 10)

04. අතමිට සල්ලි තිබේ නම් ව්‍යාපාරයක් අරඹා එය කරගෙන යෑම ලොකු කටයුක්තක් නොවේ යැයි ඔබ සමඟ සාමාන්‍ය පෙළ පන්තියේ උගත් මිතුරෙකු පවසයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්ව පාඨමාලාව හදාරන අයකු ලෙස ඔබේ මිතුරාගේ ප්‍රකාශයට ඔබ දක්වන ප්‍රතිචාරය කුමක්ද? ඔබේ අත්දැකීම් ඇසුරෙන් පිළිතුරු විකාශනය කරන්න. (ලකුණු 25)

05. කෙටියටහන් ලියන්න.

(අ) ව්‍යාපාර ආචාරධර්ම (Business Ethics)

(ආ) ව්‍යවසායකත්ව සංස්කෘතිය (Entrepreneurship Culture)

(ඇ) සුදුඅත විශ්ලේෂණය (SWOT Analysis)

(ඈ) කුඩා ව්‍යාපාර සඳහා ව්‍යාපාර ලියාපදිංචියෙහි (Business Registration) වැදගත්කම

(ඉ) පුද්ගලික ව්‍යවසායකත්ව ගතිලක්ෂණ (Personal Entrepreneurial Characteristics)

(5 x 5 = ලකුණු 25)

- හිමිකම් ඇවිරිණි -